සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

**8 ශ්‍රේණිය** | **තෙවන වාර පරීක්ෂණය - 2024** | **21 S I,II**

නම: ............................................ **සිංහල භාෂාව හා සාහිත්‍යය** **කාලය පැය දෙකයි**

★ **ප්‍රශ්න සියල්ලට ම නිවැරදි පිළිතුර තෝරන්න.**

01) ''අත හයිය නම්............. නොවරදී'' යන ආප්තෝපදේශයේ හිස්තැනට සුදුසු පිළිතුර වන්නේ,
1. වැඩ 2. කෑම 3. බත 4. රස්සාව

02) හේනක් .............................. ඇස්වැද්දීම දවසට ...................... කළ හැකි දෙයක් නොව කල් ...................... බලා සිතා................................ කළයුතු කාර්යයකි.
A - මතා B - දෙකට C - යල් D - කුඹුරක්
1. ABCD 2. BCAD 3. BDCA 4. DBCA

03) 'එළිපත්තේ ඉන්න බළලා වගෙයි'' යන ප්‍රස්තාව පිරුළේ අදහස වන්නේ,
1. බළලා එළිපත්තේ නිදා ගැනීම සිරිතක් බව 2. එළිපත්තේ නිදාගැනීම බළලාට සතුටක් බව
3. ස්ථිර තීරණයක් ගත නොහැකි බව 4. ස්ථිරව ම තීරණයක් ගෙන ඇති බව.

04) නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න,
1. කන්ඩනය, ආක්‍යාතය, ගෝසාව, බයානක 2. ආඛ්‍යාතය, කණ්ඩනය, ආබරන, චන්දය
3. ඡන්දය, ප්‍රතිපල, ආභරණ, ඝෝෂාව 4. ආඛ්‍යාතය, ඡන්දය, භයානක, ආභරණ

05) ත්‍යාග ප්‍රධානෝත්සවයට පැමිණි ආරාදිත අමුත්තන් කැඳවාගෙන විදුහල්පතිතුමා ප්‍රදාන සාලාවට පැමිණෙයි, ඉහත වාක්‍යයේ වැරදි ලෙස භාවිත කර ඇති වචන පිළිවෙලින් යෙදී ඇත්තේ,
1. ත්‍යාග, ආරාදිත, ප්‍රදාන, සාලාවට
2. ත්‍යාග, ප්‍රධානෝත්සවයට, පැමිණි, ආරාදිත
3. ප්‍රධානෝත්සවයට, ආරාදිත, ප්‍රදාන, සාලාවට
4. ප්‍රධානෝත්සවයට, ආරාදිත, කැඳවාගෙන, සාලාවය

06) අක්ෂර විනයාසය පිළිබඳව දී ඇති ප්‍රකාශ අතරින් වැරදි ප්‍රකාශය වන්නේ,
1. 'ක්' අක්ෂරයෙන් පසුව මූර්ධජ 'ෂ' යෙදේ.
2. මූර්ධජ 'ළ' වචනයක අග හල් නොවේ.
3. මූර්ධජ 'ෂ' වලින් පසුව මූර්ධජ 'ණ' යෙදීම අනිවාර්ය නොවේ.
4. 'ප' වර්ගයට අයත් අකුරකට මුලින් මූර්ධජ 'ෂ' යෙදේ.

07) අකාරාදී පිළිවෙළ නිවැරදිව යෙදී ඇති පද පේළිය වන්නේ,
1. කිහිල්ල, කිකිළි, කිවිසුම, කිරිබත 2. කිකිළි, කිරිබත, කිවිසුම, කිහිල්ල
3. කිවිසුම, කිරිබත, කිකිළි, කිහිල්ල 4. කිරිබත, කිවිසුම, කිහිල්ල, කිකිළි

08) 9567 යන සංඛ්‍යාව වචනයෙන් ලියන විට නිවැරදි පද බෙදා ලියා ඇති පිළිතුර වන්නේ,
1. නව දහස් පන්සියහැටහත 2. නවදහස් පන්සිය හැටහත
3. නවදහස් පන්සිය හැට හත 4. නවදහස් පන්සිය හැටහත

09) ''ලෙඩින් දුකින් සංහතිය ම <u>මැරීයන්</u>'' මෙහි ඉරි ගසා ඇති පදය,
1. මිශ්‍ර ක්‍රියාවකි 2. ප්‍රාර්ථනා ක්‍රියාවකි 3. පූර්ව ක්‍රියාවකි 4. විධි ක්‍රියාවකි

10) ''පුතුනි, නුඹ <u>හඬමින්</u> <u>පැමිණ</u>, මව මිය ගිය බව රජුට <u>පවසව</u>. එවිට මම පස් කා <u>මියෙම්වා</u> ! කියමින් හඬන්නෙමි. ඉහත වාක්‍යයේ ඉරි ගසා ඇති පද වර්ග පිළිවෙලින් නම් කර ඇති පිළිතුර වන්නේ,
1. මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා, පූර්ව ක්‍රියා, ආශිර්වාද ක්‍රියා 2. පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, ආශිර්වාද ක්‍රියා, විධි ක්‍රියා
3. ආශිර්වාද ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, විධි ක්‍රියා 4. මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, විධි ක්‍රියා, ආශිර්වාද ක්‍රියා



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

11) එකිනෙකට විරුද්ධ පද පමණක් යෙදී ඇති පිළිතුර වන්නේ,
1. කේවල - සමූහ, පැරණි - ඉපැරණි, දුෂ්කර - පහසු
2. කේවල - තනි, හඬ - නිහඬ, ඌන - අනූන
3. සුහද - දුගද, ශාන්තිය - ශාපය, ආධුනික - නුපුහුණු
4. ශාන්තිය - ශාපය, කේවල - සමූහ, ඌන - අනූන

12) "ශාලූක, අරවින්ද, උප්පල" යන පද වලින් හඳුන්වන මල් වර්ග පිළිවෙලින් යෙදී ඇති පිළිතුර වන්නේ,
1. නෙලුම්, මානෙල්, ඕලු
2. ඕලු, අරලිය, නෙලුම්
3. මානෙල්, ඕලු, නෙලුම්
4. ඕලු, නෙලුම්, මානෙල්

13) පහත ඇති පද අතරින් ක්‍රියා නාම පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,
1. බලන්නෝ, බලයි, නටයි, නටන්නෝ
2. නටන්නෝ, ගයන්නෝ, බලන්නෝ, දුවන්නෝ
3. සුනිල්, සමන්, කමල්, විමල්
4. උස, මහත, ලස්සන, කෙට්ටු

14) "ලීයෙන් තනන ලද" යන අදහස දෙන තනි පදය වන්නේ,
1. දැවමය
2. ලෝහමය
3. ශෛලමය
4. ස්වර්ණමය

15) "හෙළයේ මහා ගත්කරු" ලෙස හඳුන්වනු ලබන්නේ,
1. කුමාරතුංග මුනිදාස මහතා
2. මහගමසේකර මහතා
3. මාටින් වික්‍රමසිංහ මහතා
4. මර්සලින් ජයකොඩි පියතුමා

16) හරිස්චන්ද්‍ර ශබ්දකෝෂයේ දක්වන ආකාරයට 'කිරි පුබ්බරු" යනුවෙන් හඳුන්වන්නේ,
1. කිරිබත් ය
2. කිරිකොස් ය
3. කිරි එළදෙන ය
4. කිරි අලුවා ය

17) යම්කිසි ප්‍රකාශනයක මඟහැරුණු අකුරක් හෝ වචනයක් ලියා දක්වන විට භාවිත කරන විරාම ලක්ෂණය වන්නේ,
1. තිත්තුන
2. සරල වරහන
3. කාක පාදය
4. සඟල වරහන

18) උක්ත නාම පද පමණක් ඇතුළත් පද පේළිය වන්නේ,
1. මිනිසෙක්, ගැහැනියක, ඇතෙක්, ශිෂ්‍යාවක
2. ඇතෙක්, මිනිසෙකු, ගැහැනියක, වවුලෙක්
3. ගිරවෙක්, ඇතෙක්, ලේඛිකාවක්, ශිෂ්‍යාවක්
4. ශිෂ්‍යාවක, ලේඛිකාවක, කතක, ගිරවියක

19) "කිරිල්ලියෝ පැටව් රකිති" මෙම වාක්‍ය නිවැරදි වාක්‍යයක් වීමට වෙනස් කළයුතු පදය වන්නේ,
1. 'කිරිල්ලියෝ' කිරිල්ලියන් විය යුතුය
2. 'රකිති' රකියි විය යුතුය
3. 'පැටව්' පැටවුන් විය යුතුය
4. සියලුම වචන වෙනස් විය යුතුය

20) "කරන කලට පව් මීරිය මී සේ" යන කවිය ඇතුළත් කාව්‍ය ග්‍රන්ථය වන්නේ,
1. ලෝවැඩ සඟරාව
2. ලෝකෝපකාරය
3. සුභාෂිතය
4. සිරිත් මල්දම

(ල.2 x 20 = 40)



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## II කොටස

• **පළමු, දෙවන හා තෙවන ප්‍රශ්න ඇතුලුව ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.**

01) අසා ඇති කෙටි ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

i. රාජකාරි ලිපියක මූලිකාංග 02 ක් ලියන්න.
ii. රාජකාරි ලිපියක ඇතුළත් නොවන පෞද්ගලික ලිපියක ඇතුළත් වන මූලිකාංග 02 ක් ලියන්න.
iii. මාතෘකානුකූල කතාවක් ඉදිරිපත් කරන විට යොමු කළයුතු කරුණු 02 ක් ලියන්න.
iv. රචනාවක් ලිවීමේ දී අනුගමනය කළයුතු ශිල්පීය දක්ෂතා 02 ක් ලියන්න.
v. දී ඇති පද වල උපසර්ග පද යොදා විරුද්ධ පද සාදන්න.
(අ) වරද (ආ) සම
(ඇ) කුසල් (ඈ) පිරිසිදු (ල.15)

02) පහත සඳහන් මාතෘකා වලින් එකක් තෝරා ගෙන වචන 150 කට නොඅඩු රචනයක් ලියන්න.
i. වනපෙතක අසිරිය
ii. මුහුදු පතුලේ කිමිදුණෙමි
iii. මරු කැඳවන රිය අනතුරු
iv. පරිසරය රැක ගනිමු
v. දුටුගැමුණු රජතුමා

නැතහොත්

පහත ඇති ජේදය අනුව සිදුවීමට ගැළපෙන කතාන්දරයක් ගොඩනගන්න. එයට සුදුසු නිර්මාණාත්මක මාතෘකාවක් ද යොදන්න.

අහස කළු කරගෙන මහ හඬින් වැස්ස කඩා හැලෙයි. මිදුල එකම ජලාශයක් බවට පත් වී ඇත. ඉස්තෝප්පුවේ පුටුවක වාඩි වී පොතක් කියවමින් සිටි මට 'ජර බරාස්' හඬක් මහ හඬින් ඇසුණි. එය ඇසුණේ ළිඳ ළඟ ඇති ගෙඩි පිරුණු කොස් ගස පැත්තෙනි. මම 'අම්මේ.... යි මහ හඬින් කෑ ගසාගෙන ගෙට දිව්වෙමි. (ල.15)

03) පහත ඇති ජේදය කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

2016.02.16 ප.ව. 12.45 ප්‍රවෘත්ති ප්‍රකාශය
සංස්කරණය :- හේමන්ත හෙට්ටිගේ
ප්‍රකාශය :- සුජීව හරිස්චන්ද්‍ර

ජපන් මිත්‍රත්වයේ නිපොන් මාරු නෞකාව අද දිවයිනට

ජපන් මිත්‍රත්වයේ සංකේතය නිපොන් මාරු තරුණ නෞකාවෙන් දිවයිනට පැමිණ සිටින තරුණ පිරිස අද කැස්බෑව ප්‍රදේශයට පැමිණ සිටිති. එහි නිවාස 125 ක අද දවස පුරා රැඳී සිටිමින් ඔවුන් දේශීය ආහාර පාන භුක්ති විඳින අතර දේශීය සංස්කෘතික අත්දැකීම් ලබා ගනු ඇත. අද පස්වරුවේ විහාරස්ථාන කීපයක පැවැත්වෙන ශ්‍රමදාන කටයුතු කීපයට එක් වීමට නියමිත ය. පසුගිය ඉරිදා කොළඹ වරායට ළඟා වූ මෙම නෞකාව හෙට දිවයිනෙන් පිටත්ව යෑමට නියමිත ය.

i. මෙහි සඳහන් වන්නේ කුමක් ද?
ii. මෙහි සංස්කරණය කරන්නේ කවුද?
iii. මෙහි සඳහන් නෞකාවේ නම කුමක් ද?
iv. නෞකාවෙන් පැමිණි පිරිස් කරන කටයුතු දෙකක් ලියන්න.
v. නෞකාව දිවයිනෙන් පිටත් වූයේ කවදා ද? (ල.10)

04) පහත ඇති ප්‍රකාශ ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.
i. ''මම මේ තරම් සේවාවක් කළේ මගේ නම් ගම් තැන තැන අටවා ගන්න නොවෙයි''
(අ) මේ ප්‍රකාශය කළේ කවුද?
(ආ) මෙම ප්‍රකාශය අයත් පාඩම කුමක් ද?



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

ii. "ඈ බොල පුර්ණකයො, ගමය ගැන තෝ කියාපු කතා ඇත්තද?"
   (අ) මෙම ප්‍රකාශය කළේ කවුද?
   (ආ) මෙම ප්‍රකාශය අයත් නාට්‍යය කුමක් ද?
iii. "මගේ ගායනය වඩා මිහිරි වන්නේ මේ සුන්දර හරිත වන පෙත තුළයි"
   (අ) මෙම ප්‍රකාශය කළේ කවුද?
   (ආ) මෙම ප්‍රකාශය ඇතුළත් කතාවේ නම කුමක් ද?
iv. "අනේ, බලාගන්න හොඳ හැටි"
   (අ) මෙම ප්‍රකාශය කළේ කවුද?
   (ආ) මෙම ප්‍රකාශය කළ අවස්ථාව කුමක් ද?
v. "පුතාලා හරි ආසාවෙන් පත්තු කරන රතිඤ්ඤා, නිලාකුරු වගේ දේවල් අපට චීනයෙන් ලැබුණු දේවල්"
   (අ) මෙම ප්‍රකාශය කරන්නේ කවුද?
   (ආ) මෙම ප්‍රකාශය අයත් පාඩම කුමක් ද? (ල.10)

05) (අ) පහත සඳහන් වාක්‍යවල හිස්තැනට සුදුසු උක්ත පද හෝ අනුක්ත පද වරහනින් තෝරා ලියන්න.
i. කිරිල්ලියෝ .............................. රකිති. (පැටව් / පැටවුන්)
ii. ගොපල්ලා .................................. දක්කයි. (ගවයෝ / ගවයන්)
iii. .................................. දරුවන් පෝෂණය කරයි. (පියා / පියවරුන්)
iv. කොටියා ................................. මරයි. (මුවන් / මුවෝ)
v. ....................................... මීයන් අල්ලති. (බළලුන් / බළල්ලු) (ල.05))

(ආ) පහත ඇති එක් එක් අදහස සඳහා යෙදිය හැකි තනි පද ලියන්න.
i. යකඩයෙන් කරන ලද -
ii. දියගොඩ දෙකෙහිම වසන -
iii. සුපරික්ෂාකාරීව බැලීම -
iv. බොහෝ කලක සිට පැවතෙන -
v. මනා සේ රැක ගැනීම - (ල.05))

06) ඔබ මෙතෙක් ඉගෙනුම ලැබූ ග්‍රාමීය පාසලෙන් ඉවත් වී නගරයේ පාසලකට ඇතුළත් වූයේ යැයි සිතන්න. නගරයේ පාසලේ නේවාසිකාගාරයේ නැවතී ඉගෙනුම ලබන අතර ග්‍රාමීය පාසලේ හොඳම යහළුවාට / යෙහෙළියට ලියන පෞද්ගලික ලිපිය ලියන්න. (ල.10)



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## සිංහල භාෂාව හා සාහිත්‍යය - 8 ශ්‍රේණිය
## පිළිතුරු පත්‍රය

### I කොටස

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 01) 3 | 02) 4 | 03) 3 | 04) 4 | 05) 3 | 06) 3 | 07) 02 |
| 08) 2 | 09) 2 | 10) 4 | 11) 4 | 12) 4 | 13) 2 | 14) 1 |
| 15) 2 | 16) 1 | 17) 3 | 18) 3 | 19) 3 | 20) 1 | |

(ලකුණු 02x20=40)

### II කොටස

01) i. • යවන්නාගේ නම, තනතුර, ලිපිනය, දුරකථන අංකය, දිනය • ලබන්නාගේ තනතුර, ලිපිනය • ආමන්ත්‍රණය • මාතෘකාව • අන්තර්ගතය/ අදාළ කරුණු (යන කරුණු වලින් ඕනෑම දෙකක්)

ii. ආශිර්වාදය, ප්‍රාර්ථනාව

iii. • මාතෘකාවට අනුකූල වීම / අදාළ වීම • මුල මැද, අග මනා ලෙස ගැළපීම • පැහැදිලිව අදහස් ප්‍රකාශ කිරීම • නිවැරදි අංග චලනය • හඬ පාලනය • නියමිත කාලයට සීමා වීම (කාල කළමනාකරණය) (යන මේවායින් ඕනෑම 02 ක්)

iv. • අක්ෂර වින්‍යාසය • පද බෙදීම • විරාම ලක්ෂණ • පැහැදිලි අත් අකුරු නිවැරදිව භාවිතා කිරීම. (මේවායින් ඕනෑම 2 ක අදහස තිබේ නම් ලකුණු ලබා දෙන්න)

v. (අ) වරද - නිවරද (ආ) සම - අසම (ඇ) කුසල් - අකුසල් (ඈ) පිරිසිදු - අපිරිසිදු (ලකුණු 15)

02) රචනාවක මූලික කරුණු පිළිබඳව අවධානය යොමු කර සුදුසු ලකුණක් ලබා දෙන්න. (ලකුණු 15)

03) i. 2016.02.28 ප.ව. 12.45 ප්‍රවෘත්ති ප්‍රකාශය.

ii. හේමන්ත හෙට්ටිගේ / හේමන්ත හෙට්ටිගේ මහතා

iii. ජපන් මිත්‍රත්වයේ සංකේතය නිපොන් මාරු නෞකාව

iv. • දේශීය ආහාරපාන භුක්ති විඳීම • දේශීය සංස්කෘතික අත්දැකීම් ලබා ගැනීම • විහාරස්ථාන කීපයක ශ්‍රමදාන කටයුතු කිරීම (මේවායින් ඕනෑම 2 ක්)

v. 2016.02.17 වන දින (ලකුණු 10)

04) i. (අ) මොහොට්ටි වත්තේ ගුණානන්ද හිමි (ආ) බොදු පුනරුදයේ සෙන්පතියාණෝ

ii. (අ) කාළහීෂණ / යක්පති (ආ) පරාස්ස නාට්‍යය

iii. (අ) පුංචි කිරිල්ලිය / සැබෑ නයිටිංගේල් (ආ) සැබෑ ළෙන්ගතුකම

iv. (අ) පියසේනගේ මව / අවුරුදු සිහිනය කෙටි (ආ) පියසේනගේ මව පියසේන කැඳවාගෙන යන අවස්ථාවේ දී

v. (අ) පියා (ආ) අලුත් අවුරුදු උත්සවය (ලකුණු 10)

05) (අ) i. පැටවුන් ii. ගවයන් iii. පියා iv. මුවන් v. බළල්ලු (ලකුණු 05)

(ආ) i. ලෝභමය ii. උභය ජීවි iii. නිරීක්ෂණය iv. විරාගත v. සංරක්ෂණය (ලකුණු 05)

06) සුදුසු පරිදි ලකුණු ලබා දෙන්න. (ලකුණු 10)



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com